ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 1 - 2008/09

වාණිජ්‍ය නීතිය - **LWU 4324**

කාලය - විනාඩි 40

---

දිනය - 2008.10.16 වේලාව - පෙ.ව. 11.30 - ප.ව. 12.10 දක්වා

---

අපැහැදිලි අත් අකුරුවල ට ලකුණු අඩු කරනු ලැබේ.

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

01. "1896 අංක 11 දරණ භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ භාෂාවෙන් පෙනෙන්නේ එය කිනම් අයුරකින් හෝ විකුණුම්කරු ආරක්ෂා කිරීමට අත්‍යවශ්‍යයෙන් ම අදහස් කර නොමැති බවයි."

ඉහත ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නෙහි ද? ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩුතීරණ ඇත්නම් ඒවා ඇසුරෙන් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

02. පහත සඳහන් අවස්ථාවන්හිදී විවිධ පාර්ශවකරුවන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම් සලකා බලන්න.

**(a)** නුවන්ගෙන් කාරයක් මිලදී ගන්නා කමල් එසැනින්ම එය තුසිරට විකුණයි. කෙසේවුවද තමන් ගිවිස ගැනීමට අදහස් කලේ කමල් සමග නොව වෙනත් අයෙකු සමගය යන පදනම මත ගිවිසුම අවලංගු කිරීමට කමල්ට එරෙහිව නුවන් නඩු පවරා ඇත.

**(b)** අරුණ, ඉදුනු තක්කාලි තොගයක් 2008 ඔක්තෝබර් 10 වන දින රුචිරට විකිණිය. කෙසේ වුවත් මේ වනතෙක් ඒ සඳහා මිල ගෙවා නැත.

**(c)** බිමල්, රු. 1,20,000/- කට රූපවාහිනියක් අමන්දාට විකිණීය. කෙසේවුවද, බිමල් විසින් එය ඒ වන විටත් සමන්ට උකස් කර තිබිණි. මේ බව අමන්දා නොදැන සිටියාය.

**(d)** නැවුම්ව අඹරාගත් කුරක්කන් පිටි මළු 200 ක් ටෝනිට විකිණීමට කාංචනා එකඟ වූවාය. එහෙත් ඒවා බාරදීමට පෙර කෘමිනාශක සමග මිශ්‍රවිය.

- හිමිකම් ඇවිරිණි. -